# සුවෙන් පෙරට
# e ඉගෙනුම් පියස
# මිනුවන්ගොඩ

- ශ්‍රේණිය - 10
- විෂයය - ඉතිහාසය
- පාඩම - 08 - මහනුවර රාජධානිය (1 කොටස )


- සැකසුම - තමාලි පෙරේරා
  නියෝජ්‍ය විදුහල්පති
  මිනු/ බලබෝව කණිෂ්ඨ විද්‍යාලය

# මහනුවර රාජධානිය
# 1 කොටස





## ➢ මහනුවර රාජධානිය හැදින්වූ වෙනත් නම්

- සෙංකඩගල නුවර
- උඩරට රාජධානිය
- කන්දෙ නුවර



## ➢ පිහිටීම

- ස්වභාවික රැකවරණයකින් යුක්තය
- ගිරි දුර්ග,ජල දුර්ග හා වන දුර්ගවලින් වටවී පිහිටා තිබුණි
- බලන, හුන්නස්ගිරිය වැනි දුර්ග මාර්ග නිසා  මෙම ප්‍රදේශයට ඇතුළු වීම දුෂ්කර විය

| | |
|---|---|
| ගිරි ශිඛරයෙන් වන වදුලෙන් | බාධකය |
| පර සතුරන්ට එරෙහිව ලැබ දුනි | සවිය |
| සුන්දර බවේ නිදසුන මහවැලි | නදිය |
| කඳුරට ලලන ගෙල පැළඳුව මුතු | හරය |

## ➢ උඩරට රජ පරපුර

1.සේනා සම්මත වික්‍රමබාහු
2. ජයවීර බණ්ඩාර
3.කරලියද්දේ බණ්ඩාර
බෑණා - යමසිංහ බණ්ඩාර
දියණිය - කුසුමාසන දේවිය



- සීතාවක රාජසිංහ රජුගේ උඩරට ආක්‍රමණය
- කරලියද්දේ බණ්ඩාර දියණිය සහ බෑණා සමඟ පෘතුගීසින් වෙත පලා යාම

## ➢ බෞතීස්ම නාම

- යමසිංහ බණ්ඩාර - දොන් පිලිප්
- කුසුමාසන දේවිය - දෝනකතරිනා

- සීතාවක රාජසිංහ රජුට උඩරට ආක්‍රමණය සඳහා සහය ලබාදුන්නේ උඩරට ප්‍රභූවරයෙකු වූ වීරසුන්දර බණ්ඩාරය
- නමුත් පසුව සීතාවක රාජසිංහ රජු  වීරසුන්දර බණ්ඩාර මරා දැමීය
- ඉන් කලකිරීමට පත්  වීරසුන්දර බණ්ඩාරගේ පුත් කොනප්පු බණ්ඩාර පෘතුගීසීන් වෙත පලා ගියේය

- බෞතීස්ම නාමය
  කොනප්පු බණ්ඩාර - **දොන් ජුවන්**

- පෘතුගීසීන්ගේ අණ පරිදි කොනප්පු බණ්ඩාර විසින් යමසිංහ බණ්ඩාර උඩරට රජ කරවන ලදී .

- කෙටි කලකින් යමසිංහ බණ්ඩාර මිය ගිය බැවින් කොනප්පු බණ්ඩාර උඩරට රජකම ලබා ගත්තේය





# පළමුවන විමලධර්මසූරිය රජතුමා

**(කොනප්පු බණ්ඩාර)**

**1592 - 1604**

1592 – 1604



## ➢ පළමුවන විමලධර්මසූරිය රජුට මුහුණ දීමට සිදු වූ අභියෝග

- නීත්‍යානුකූල රජ උරුමයක් නොවීම
- උඩරට රාජධානිය පෘතුගීසි ග්‍රහණයෙන් බේරාගත යුතු වීම
- උඩරට රාජ්‍යය සීතාවක බලපෑමෙන් මුදවා ගත යුතු වීම
- පරිහානියට පත් බුදු සසුන නගා සිටුවිය යුතුවීම
- මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කළ යුතු වීම



## ❑ අභියෝග ජයගැනීම

### ➢ නීත්‍යානුකූල රජ උරුමය තහවුරු කරගැනීම

- ❖ උඩරට සැබෑ රජ උරුමකාරිය වූ කුසුමාසන දේවිය විවාහ කර ගැනීමෙන් නීත්‍යානුකූල රජ උරුමය තහවුරු කරගැනීම
- ❖ කතෝලික ආගම අතහැර විමලධර්මසූරිය නම් බෞද්ධ නම ලබා ගැනීම
- ❖ මහනුවර දළදා මන්දිරයක් ඉදි කිරීම



## ❑ උඩරට රාජධානිය පෘතුගීසි බලපෑමෙන් නිදහස් කර ගැනීම

- පෘතුගීසි ආක්‍රමණවලට සාර්ථකව මුහුණ දීම

  උදා: දන්තුරේ සටන

  බලන සටන





- සීතාවක රාජධානියේ බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම

- සිතාවක පළමුවන රාජසිංහ රජු සමඟ සටන් කර ඔහු පරාජය කිරීම



## ❑ පරිහානියට පත් බුදු සසුන නගාසිටුවීම


- බුරුම දේශයෙන් උපසම්පදා භික්ෂූන් වැඩමවා උපසම්පදා විනය කර්මය යළි ආරම්භ කිරීම
- දෙල්ගමුව විහාරයේ කුරහන් ගලක සඟවා තිබූ දළදා වහන්සේ මහනුවරට වැඩමවා දළදා මන්දිරයක තැන්පත් කිරීම
- වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කිරීම






## ❑මහනුවර රාජධානියේ ආර්ථික කටයුතු දියුණු කිරීම

- ගොවිතැන දියුණු කිරීමට කටයුතු කිරීම
- කපු වගාව දියුණු කිරීමට අනුබල දීම
- කොත්මලේ හා වලපනේ ප්‍රදේශයේ යකඩ හා වානේ කර්මාන්තය දියුණු කිරීම
- උඩරට රාජධානිය ආශ්‍රිත වෙඩි ලුණු කර්මාන්තයේ දියුණුවට පියවර ගැනීම






## ❖ සෙනරත් රජතුමා

- පළමුවන විමලධර්මසූරිය රජුගේ ඥාති සහෝදරයෙකි
- රජ උරුමය තහවුරු කරගැනීම සඳහා කුසුමාසන දේවිය විවාහ කර ගත්තේය
- මෙතුමාටද පෘතුගීසි තර්ජනවලට මුහුණ දීමට සිදුවිය

**මෙතුමාගෙන් පසු බාල පුත් මහ අස්ථාන කුමරු රජ විය**




කුසුමාසන දේවිය
පළමුවන විමලධර්මසූරිය
කුමාරසිංහ
ඌව
විජේපාල
මාතලේ
සෙනරත් රජු
මහ අස්ථාන
මහනුවර
2 වන රාජසිංහ නමින් රජවේ

❖ දෙවන රාජසිංහ රජතුමා

(මහ අස්ථාන කුමරු)

1635 - 1687




## ❖ දෙවන රාජසිංහ රජතුමා ට මුහුණ දීමට සිදුවූ අභියෝග

- පෘතුගීසීන්ගෙන් උඩරටට එල්ල වන ප්‍රහාර මැඩ පැවැත්වීම
- පෘතුගීසින් මෙරටින් පලවා හැරීම
- උඩරට රදළ ප්‍රධානීන්ගෙන් එල්ල වූ තර්ජන අවම කර ගැනීම
- ලන්දේසි බලපෑමෙන් උඩරට නිදහස් කර ගැනීම

මෙතුමා පෘතුගීසි ආක්‍රමණ දෙකකට සාර්ථකව මුහුණ දුන්නේය
උදා:**රන්දෙනිවෙල සටන**
**ගන්නෝරුව සටන**

1638 ගිවිසුම හරහා ලන්දේසීන්ගේ සහය ලබාගෙන පෘතුගීසීන් මෙරටින් පන්නා දැමීය



## ➢ දෙවැනි විමලධර්මසූරිය රජතුමා

- සාමකාමී පාලකයෙකි
- බුරුම දේශයෙන් උපසම්පදා භික්ෂූන් වැඩම කරවා උපසම්පදා විනය කර්මය යළි ආරම්භ කළේය



## ➢ ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ රජතුමා ( සිංහල රජ පරපුරේ අවසන් රජුය )

- නායක්කර් සිරිතට අනුව බිසවගේ සොහොයුරාට රජකම පැවරීය



# ❑ නායක්කර් රජ පෙළපත

1.ශ්‍රී විජය රාජසිංහ රජතුමා
2.කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා
3.රාජාධි රාජසිංහ රජතුමා
4.ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා



## ❖ ශ්‍රී විජය රාජසිංහ රජතුමා

- මෙතුමා දකුණු ඉන්දියානු කුමාරියක් සරණපාවා ගත්තේය
- නමුත් දරුවන් නොසිටි බැවින් රාජ්‍ය උරුමකරුවකු නොතබාම  මිය ගියේය

## ❖ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා




- මෙකල බුදුසසුන බෙහෙවින් පරිහානියට පත්ව තිබුණි
- එනිසා රජතුමා වැලිවිට සරණංකර හිමියන්ගේ උපදෙස් පරිදි රට පුරා බෞද්ධ ප්‍රබෝධයක් ඇති කිරීමට කටයුතු කළේය

➢ ඒ සඳහා ගත් පියවර

- සියම් දේශයට දූතයන් යවා උපාලි හිමියන් ප්‍රමුඛ භික්ෂූන් මෙරටට වැඩමවා යළි උපසම්පදාව පිහිටුවීම
- ( එමඟින් වර්තමාන සියම් නිකාය ආරම්භ විය )
- උඩරට හා පහතරට ප්‍රදේශවල වෙහෙර විහාර ප්‍රතිසංස්කරණය කරවීම
- වැලිවිට සරණංකර හිමියන්ට සංඝරාජ තනතුර පිරිනැමීම

## ❖ රාජාධි රාජසිංහ රජතුමා


- මෙකල එනම් ක්‍රි.ව.1796 දී ඉංග්‍රීසින් ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ අල්ලා ගත්හ

## ❖ ශ්‍රී වික්‍රම රාජසිංහ රජතුමා

- මෙතුමා රාජ්‍යත්වයට පත් වූයේ පිළිමතලව්වේ මහ අධිකාරම්ගේ අභිමතය පරිදිය
- රාජ්‍යත්වයට ප්‍රථම මෙතුමා කන්නසාමි නම් විය
- මෙම රජු නායක්කර් ඥාතීන්ගේ බසට අවනත වීම නිසා රදළ පිරිස් හා රජු අතර සබඳතාව බිඳ වැටුණි
- ඉංග්‍රීසීන් මෙම රජුගේ කාලයේ දී දෙවතාවක් උඩරට ආක්‍රමණය කළහ (1803, 1815)
- 1803 දී උඩරැටියන්ගේ සහායෙන් ඉංග්‍රීසි හමුදාව පරාජය කිරීමට රජු සමත් විය
- නමුත් රජුගේ අමානුෂික ක්‍රියා කලාපයන් නිසා පසුව රජුට ජනතා පක්ෂපාතීත්වය අහිමි විය
- උපක්‍රමශීලීව කටයුතු කළ ඉංග්‍රීසින් 1815 දී රජු අත්අඩංගුවට ගනිමින් උඩරට රාජධානිය යටත් කර ගත්හ
- ඉන්පසුව ශ්‍රී වික්‍රම රාජසිංහ රජු වෙල්ලෝරයට පිටුවහල් කරන ලදී

## ➢ උඩරට රජවරු

- සේනා සම්මත වික්‍රමබාහු
- ජයවීර බණ්ඩාර
- කරලියද්දේ බණ්ඩාර
- යමසිංහ බණ්ඩාර
- පළමුවන විමලධර්මසූරිය (කොනප්පු බණ්ඩාර )
- සෙනරත්
- දෙවන රාජසිංහ (මහා අස්ථාන කුමාරයා )
- දෙවන විමලධර්මසූරිය
- ශ්‍රී වීර පරාක්‍රම නරේන්ද්‍රසිංහ
- ශ්‍රී විජය රාජසිංහ
- කීර්ති ශ්‍රී රාජසිංහ
- රාජාධි රාජසිංහ
- ශ්‍රී වික්‍රම රාජසිංහ



ස්තුතියි!

තමාලි පෙරේරා